# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2113/56 – 2019 මාර්තු 07 වැනි බ්‍රහස්පතින්දා – 2019.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/04/වී/2015/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එම්. අයි. පී. කුලතිලක මිය, ''උපමාලි'', බෙරගල, කෑගල්ල.

සහ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වැනි මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මැණික්දිවෙල, ශ්‍රී ප්‍රේමරතන මාවත, අංක 22/1, එස්. ජී. සූරියආරච්චි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: අයිආර්/සීඕඑම්/04/වී/2015/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම්. අයි. පී. කුලතිලක මිය., ''උපමාලි'', බෙරගල, කෑගල්ල.

සහ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 1 වැනි මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ III ශ්‍රේණියේ විධායක නිලධාරි තනතුරක සේවය කළ එම්. අයි. පී. කුලතිලක මිය. ඊට පහළ ශ්‍රේණියක් වූ කණිෂ්ඨ කළමනාකාර තනතුරේ පිහිටුවීමෙන් වැටුප්, වාර්ෂික වැටුප් වර්ධක, අනෙකුත් වරප්‍රසාද හා උසස්වීම් අහිමිවීමෙන් අසාධාරණයක් සිදු ව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 1017